# ලාංකික බෝධිඝරය

## සේනක බණ්ඩාරනායක

පැරණි ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණය පොදුවේ සලකා බලන විට ගල්, ගඩොල් සහ දැව මිශ්‍ර ගෘහ නිර්මාණයකි. එම ගෘහ නිර්මාණයේ මුල් සැරසිලි හා අලංකරණ විධි බෙහෙවින් විනාශ වී ඇති අතර ඒවායින් දැනට ඉතිරිව ඇති වැදගත් ම අංග වන්නේ ගොඩනැගිලි සහ සැලසුම් ආකල්පය විසිතුරු විහාර සංකීර්ණ, රාජකීය බලකොටු විනෝද උයන්, විස්තෘත වාරික්‍රම සහ පැරණි වඩුවන්, පෙදරේරුවන් සහ ඉංජිනේරුවන් මුදුන් පමුණුවා ගත් සාම්ප්‍රදායික වාස්තු විද්‍යාත්මක දියුණුව පිළිබිඹු කෙරෙන නොයෙකුත් ගොඩනැගිලි ඊට ඇතුළත් ය.

ශ්‍රී ලංකාවේ විහාර සමග සම්බන්ධ එවැනි ගොඩනැගිලි විශේෂයක් ගැන මේ ලිපියෙන් විස්තර කර ඇත. බැලූ බැල්මට වෙන වෙනම ගොඩනැගිලි රැසක් ලෙස පෙනෙන මේ අමුතු ගොඩනැගිලි විශේෂය පිළිබඳව කෙරුණු පුරාවිද්‍යාත්මක කටයුතු ප්‍රධාන වශයෙන් අවධි තුනකට වෙන් කළ හැකිය. එනම් 1890 ගණන් වල, 1960 ගණන් වල සහ ඒ අතරතුර කෙරුණු කට යුතු ස්වල්පය ලෙසය.

දේශීය පුරාවිද්‍යාඥයන් විසින් මේ ගොඩනැගිලි විශේෂය විවිධාකාරයෙන් හඳුන්වා දී ඇත. මේ අතරින් අසලොස්සක් බෝධිඝර ලෙස හඳුනාගනු ලැබිය. මේවා-මේවායින් වැඩිකොටසක් එක විශේෂ වර්ගයකට හෝ කාණ්ඩයකට ඇතුළත් කොට නොමැත. ඇතැම් ඒවා විස්තර කර ඇත්තේ පිළිම ගෙවල් හා වටදාගෙවල් ලෙසය. 1960 ගණන් වල කැණින ලද ස්මාරක වල අමුතු අර්ථ නිරූපන ඉදිරිපත් කර ඇත.

මගේ අරමුණ මේ සියළුම ගොඩනැගිලි ලාංකික බෝධිඝරයේ නොයෙකුත් විශේෂණ බව පෙන්වා දීමටය.

බෝධිඝරය, භාරතයේ නොයෙක් පළාත් වලින් ලැබුණු බෞද්ධ ප්‍රාථමික උන්නත රූකම්වල දක්නට ලැබෙන සම්ප්‍රදායික වාස්තු නිර්මාණයකි. එහෙත් දැනට මා දන්නා තරමින් ආසියාවේ වෙන කිසිම තැනක වාස්තු විද්‍යා වාර්තාවේ මෙවැනි ගොඩනැගිලි විශේෂයක් දක්නට නොමැත.

ලාංකික බෝධිඝර වැඩි වශයෙන්ම අයත් වන්නේ ක්‍රිස්තු වර්ෂ 8 - 10 ශතවර්ෂ වලටය. එහෙත් ඊට පෙර සහ පසු කාලයට අයත් නිදසුන්ද අනුව හැකිය. ලාංකික බෞද්ධ විහාරයක ප්‍රධාන පූජනීය අංගයක් ලෙස බෝධිය දැරූ වැදගත්කම මුළු ඉතිහාසය පුරාම පැවති ඇත. මෙහි ආරම්භය ක්‍රිස්තු පූර්ව 3 වන ශතවර්ෂය විය හැකිය. ඕනෑම නූතන විහාරයක හෝ පන්සලක බෝධියේ වැදගත්කම සහ පූජනීයත්වය ස්තූපය සහ පිළිමගෙය සමඟ සමතාවයක් දරයි. එසේ වුවත් අද බෝමළුව හෝ බෝ කොටුව කැපී පෙනෙන තිරසාර අංගයක් නොවන අතර, එය අනුරාධපුර ශ්‍රී මහා බෝධිස්ථානයේ දක්නට ලැබෙන ගෘහනිර්මාණ සැරසිලි දක්වන්නේ ඉතාමත් කලාතුරකින්ය.

අනුරාධපුර ශ්‍රී මහා බෝධිය, පොළෝ මට්ටමේ සිට මීටර් 5 ක් හෝ 6 ක් පමණ උස, වටකරන ලද වේදිකාවක හෙවත් මධ්‍ය සිද්ධස්ථානයක පිහිටා ඇති බව විමසිල්ලෙන් බලන විට පැහැදිලි වේ. එය එය වටකරන ලද වේදිකා රැසකින්ද, දිසා අනුව පිහිටුවන ලද නොයෙකුත් පිළිම



POSTGRADUATE INSTITUT

ගෙවල්, මළුපෙත්'සහ පියගැට පෙළින් වටවී ඇත.

නූතන බෝධිඝරවල දක්නට ලැබෙන සරල බව නිසාදෝ, **1890** ගණන් වල සිට කැණ මතුකරගත් ස්මාරක අතරින් බෝධිඝර වෙන්කර හඳුනාගැනීමට දේශීය පුරාවිද්‍යාඥයින්ට අපහසුවී ඇත. අනුරාධපුර පාචීන තිස්ස පබ්බත විහාරයේ මැද මළුවේ, නිරිත දිගකොටසේ පිහිටි ස්මාරකය බෝධියකට තැනූ වේදිකාවක් වීමට ඉඩ ඇති බවට මහාචාර්ය පරණවිතාන අදහස් ඉදිරිපත් කළේ 1940 ගණන්වල මෑත හරියේදී පමණය. පරණවිතානගේ මේ 'ඉඟිය' අතිශයින වැදගත් වූයේ, එම ස්මාරකය විහාර සංකීර්ණයකට අයත් එක් ප්‍රධාන ගොඩනැගිල්ලක් වූ නිසාය.

**1895** දී අවධානයට යොමු වූවද, හඳුනාගත නොහැකිව තිබූ. සැහෙන හොඳින් ආරක්ෂාවී තිබුණු නිල්ලක්ගම ස්මාරකයක්, පරණවිතාන විසින් **1950** ගණන් වල මුල දී කැණ, තහවුරු කර නිශ්චිත වශයෙන්ම බෝධිඝරයක් ලෙස හඳුනා ගනු ලැබීය. ශිලා ලේඛනයක් මගින් මේ ස්මාරකය පැහැදිලිවම බෝධිඝරයක් ලෙස හඳුන්වා ඇති අතර, එම ශිලා ලේඛනයේ ආධාරයෙන් මේ ස්මාරකය ක්‍රිස්තු වර්ෂ **8** වැනි හෝ **9** වැනි ශතවර්ෂයට කාල නිර්ණය කළහැකි විය. මෙය කෙතරම් දුර්ලභ ගණයේ සොයා ගැනීමක් ද කිවහොත් එය තවමත් හැඳින්වෙන්නේ 'අසමසම' සොයා ගැනීමක් ලෙසය. එහෙත් මේ 'අසම සම' බව රඳා පවතින්නේ අභාවයට ගිය ස්මාරකයක හුදකලා නිදර්ශනයක් නිසා නොව, එහි මනා ශේෂිත තත්වය නිසා බව අපට පෙන්වා දිය හැකිය. එපමණක් නොව, මේ වර්ගයේ නිදර්ශනයක් නිශ්චිත ලෙස හඳුනා ගැනීමේ මුල්ම අවස්ථාව වීමේ වරම ද නිල්ලක්ගම බෝධිඝරයට හිමිය.

මේ සොයාගැනීමේ ආකෘතිමය වැදගත්කම පිළිබඳ තරමක හැඟීමක් දේශීය පුරාවිද්‍යාඥයින් තුළ ඇතිවූයේ 1960 ගණන් වන විටය. මෙය නොදැනුවත්ව ම පාහේ සිදු වූ අතර, බෝධිඝර පිළිබඳ සුළු සුළු විස්තර තැන තැන පළවන්නට විය. ම විසින් ද **1965** දී පොළොන්නරුවේ දළදා මළුවේ පිහිටි එවැනි ගොඩනැගිල්ලක් හඳුනාගත් අතර මුද්‍රණය නොකරන ලද නිබන්ධනයක සඳහන් කර ඇත. මෙවැනි 'පාවෙන අදහස්' පී. එල්. ප්‍රේමතිලක සහ රෝලන්ඩ් සිල්වා **1968** දී ලියූ ලිපියක වඩා සපිර ස්වරූපයකින් යොදාගනු ලැබීය. මෙය තරමක මහායාන ආභාසයක් කියාපාන ඇතැම් ලාංකික විහාර වර්ගයක් පිළිබඳව කතුවරුන් දෙදෙනාගේ අදහස් දක්වන ලද ලිපියක් විය. එම පර්යේෂණයේ දී එම විහාරවල දක්නට ලැබෙන, පාචීනතිස්ස පබ්බත විහාර ඉහත දැක්වූ ස්මාරකයට සමාන පිහිටීමක් ඇති ස්මාරක වර්ගයක් 'බෝධිඝර' ලෙස හඳුන්වා ඇත. නිල්ලක්ගම බෝධිඝරය ගැන හැරුණු විට අන් හඳුනාගැනීම්වල පදනම ගැන අප කිසිවෙකුත් තර්ක කරනු තබා, බෝධිඝර ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කිරීමක් වත් ඒ වන විට කර නොතිබුණේය. ඒ හැම විටම අහම්බෙන් සත්‍ය වූ, අනුමාන සහිත, පදනම් රහිත හඳුනාගැනීම් මත අප නිගමනයන්ට මුල පිරුණි.

මෙය, මේ සම්බන්ධ මගේ පර්යේෂණ වල ආරම්භක ස්ථානය විය. නිල්ලක්ගම ස්මාරකයේ අංග ලක්ෂණ වර්ගීකරණය කර වෙනත් ඇතැම් ස්මාරකයන්ට යෙදිය හැකි බව මෙහි දී පැහැදිලි විය. නිල්ලක්ගම බෝධිඝරයේ බිම් සැළැස්ම චතුරශ්‍රාකාර වූ අතර, එයට දිශා අනුව නියම කරන ලද පැතිවල මැද පිහිටි දොරටු දෙකක් විය. මෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ මධ්‍ය සිද්ධ ස්ථානය ය. මූලික සැළැස්ම ගැන සලකන විට ඉන් ඉදිරිපත් වූයේ පෙර වහලකින් ආවරණය වුනු, ගල් අල්ලා තනන ලද, චංක්‍රමනයකින් පිටවුණු අහසට විවෘත පස් පුරවන ලද වලකි. මිට පෙර ප්‍රාථමික බෞද්ධ රූකාඩවල පමණක් දක්නට ලැබුණු කුමාරස්වාමි වෙනම ගෘහනිර්මාණ විශේෂයක් ලෙස අධ්‍යයනය කරන ලද, අහසට විවෘත ස්මාරක වර්ගයක් මේ මුළු ගොඩනැගිල්ලෙන්ම දිස්විනි. නිල්ලක්ගම ස්මාරකයට සමාන ආකෘතියකින් යුත් අනෙකුත් ලාංකික ස්මාරක වල අනුමාන ගොඩනැන් වීම් ඉන්දීය උන්නත රූකම් වල එන අතැම් ගොඩනැගිලි වල මූලික සැලසුම් වලට හුරු ගොඩනැගිලි ලබාදෙයි.